#mediaethicsSL #Sinhalanews #TVchannels #lka #HiruTv #TvDerana #Swarnavahini #SiyathaTv

ශෝකය හා කම්පනය ඇතිකරවන සිදුවීමක් සම්බන්ධයෙන් කරුණු විමසීමේදී ජනමාධ්‍යවේදීන් නිසි සංවේදීතාවයෙන් හා ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුව කටයුතු කිරීම අවශ්‍ය බව ජාත්‍යන්තර ජනමාධ්‍ය ආචාර ධර්ම සම්මුතීන්හි සඳහන් වේ. එවන් අවස්ථාවකදී ජනමාධ්‍යවේදියා විසින් සහකම්පනයෙන් හා මානුෂීයත්වයෙන් යුතුව හැසිරිය යුතු වන අතරම, කම්පනයෙන් පසුවන්නන් හා කටයුතු කිරීමේදී විශේෂයෙන්ම සැලකිලිමත් විය යුතුය. එසේම ජනමාධ්‍යවේදියා විසින් යම් ප්‍රකාශයන් ලබාගැනීමට පෙරාතුව, එම ප්‍රකාශ ලබාදෙන්නා මුහුණ පා සිටිනා කම්පනය තක්සේරු කොට ඊට අනුව කටයුතු කිරීමද අවශ්‍ය වේ.

කෙසේ වෙතත් පසුගියදා අනතුරකදී මියගිය අයගෙන් එක් අයෙකුගේ මවගෙන් මාධ්‍යවේදීන් ප්‍රකාශ ලබාගන්නා ආකාරය නිරීක්ෂණය කරනා විට, ඉහත ආකාරයේ ආචාර ධාර්මික හැකියාවක් පිළිබිඹු වන්නේද යන්න පැනයකි. මෙහිදී මුලින්ම එම මව තම පුතා මියගොස් සිටිනා බවක් නොදැන තොරතුරු ලබාදෙන බව වැටහේ. ඉන් පසුව එය දැනගත් ඇය කම්පනයට පත්ව හඬා වැළපෙන අයුරුද එම මාධ්‍යවේදීන් විසින් තම පුවත් විකාශය ඔස්සේ රටම හා බෙදාගනී.

ශෝකය හා කම්පනය ඇතිකරවන සිදුවීමක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ජනමාධ්‍යවේදීන් යලි යලිත් සැලකිලිමත් විය යුතු බව මොනවට පෙන්නුම් කරන්නක් ලෙසින් මෙම රූපවාහිනී ප්‍රවෘත්ති වාර්තාව සැලකිය හැක.